ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha

**ගම්පහ අධ්‍යාපන කලාපය**
# Gampaha Education Zone

**දෙවන වාර ඇගයීම - 2025**
## Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 13 | විෂයය Subject: ආර්ථික විද්‍යාව - I | කාලය Time: පැය 02 |

නම : ..............................................................................................

උපදෙස්

★ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1. ආර්ථිකය සමස්තයක් ලෙස ගෙන එහි ව්‍යුහය, හැසිරීම හා කාර්ය සාධනය අධ්‍යයනය කිරීම සූක්ෂම ආර්ථික විද්‍යාවෙන් සිදු කෙරේ.
   2. ආර්ථික පද්ධතියත් තුළ සිටින විවිධ ඒකක වෙන් වෙන් වශයෙන් ගෙන අධ්‍යයනය කිරීම සාර්ව ආර්ථික විද්‍යාවෙන් සිදු කෙරේ.
   3. සමස්ථ පරිභෝජනය, ආයෝජනය, ආනයනය හා අපනයනය කටයුතු අධ්‍යයනය කරනු ලබන්නේ සූක්ෂම ආර්ථික විද්‍යාවෙනි.
   4. නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර භාවිතා කරනු ලබන්නේ සූක්ෂම ආර්ථික විද්‍යාවට අයත් විෂය කරුණු පැහැදිලි කිරීම සඳහා පමණි.
   5. ආර්ථිකයේ සමස්ත ක්‍රියාකාරීත්වය සාර්ව ආර්ථික විද්‍යාවෙන්ද එකී කොටස් වෙන් වෙන් වශයෙන් ගෙන සූක්ෂම ආර්ථික විද්‍යාවෙන් ද අධ්‍යයනය කෙරේ.

02. ආර්ථික විද්‍යා ශිෂ්‍යයෙකු වශයෙන් ඔබට එකඟ විය හැකි ප්‍රකාශය හඳුනා ගන්න.
   1. සිසුනට නොමිලේ සපයන පාසල් පොත් ආර්ථික භාණ්ඩයක් නොවේ.
   2. නියං කාලයේදී වර්ෂාව නැති බැවින් වර්ෂා ජලය හිඟ භාණ්ඩයක් බවට පත් වේ. එබැවින් එය ආර්ථික භාණ්ඩයකි.
   3. මිනිස් ජීවිතය සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ ආර්ථික භාණ්ඩ වේ.
   4. බීමට සුදුසු ජලය ජනතාවට ආර්ථික භාණ්ඩ වේ.
   5. නොමිලේ සපයන සියලු දෑ ආර්ථික භාණ්ඩ නොවේ.

03. නොමිලේ සපයන පහත දැක්වෙන භාණ්ඩ හා සේවා අතුරින් ආවස්ථික පිරිවැයක් පවතින්නේ කුමන භාණ්ඩයක් සම්බන්ධයෙන්ද?
   1. සංචාරක ආකර්ෂණයක් බවට පත් වී ඇති දිය ඇල්ලක්.
   2. රෙදි වේලීම සඳහා භාවිතා කරන හිරු එළිය.
   3. සිසුනට ලැබෙන මහපොළ ශිෂ්‍යත්ව.
   4. නිරිත දිග මෝසම් වර්ෂාව.
   5. වායුගෝලීය ආර්ද්‍රතාවය.

04. ආදායම් බෙදීයාම පිළිබඳ ප්‍රශ්න ලෙස අදහස් කරන්නේ,
   1. අනාගතය සඳහා සම්පත් බෙදා වෙන් කරන්නේ කෙසේද යන්නයි.
   2. කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේ ද යන්නයි.
   3. කෙසේ නිෂ්පාදනය කරන්නේ ද යන්නයි.
   4. කොපමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්නේද යන්නයි.
   5. කුමන භාණ්ඩ නිෂ්පාදනය කරන්නේද යන්නයි.

05. සම්පත් වල ඵලදායීතාවය ඉහළ යාම යනුවෙන් අදහස් කරන්නේ,
1. යෙදවුම් ප්‍රමාණය වැඩි කරන වේගයට වඩා වැඩි වේගයකින් නිමැවුම වැඩි වීම.
2. කිසියම් නිමැවුම් ප්‍රමාණයක් නිපදවීමට අවශ්‍ය යෙදවුම් ප්‍රමාණය අඩු වීම.
3. යෙදවුම් ස්ථාවරව තිබියදී නිපදවිය හැකි නිමැවුම් ප්‍රමාණය ඉහළ යාම.
4. යෙදවුම් අඩුකරන වේගයට වඩා අඩු වේගයකින් නිමැවුම අඩු වීම.
5. ඉහත සියල්ලම.

06. පෞද්ගලික ඉල්ලුමේ වෙනසක් ඇති වීමට හේතු නොවන්නේ,
1. ආදේශන භාණ්ඩ මිල වෙනස් වීම
2. සලකා බලන භාණ්ඩයේ මිල වෙනස් වීම.
3. අනුරූපක භාණ්ඩ මිල වෙනස් වීම.
4. පාරිභෝගික රුචිය වෙනස් වීම.
5. අනාගත මිල අපේක්ෂාවන් වෙනස් වීම.

07. එක්තරා භාණ්ඩයක මිල පහළ ගිය විට ආදේශන ප්‍රතිවිපාකය යටතේ ඉල්ලුම් ප්‍රමාණය ඒකක 100කින් ඉහල ගියේය. ආදායම් ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් ප්‍රමාණයට ඒකක 50කින් අඩු විය. අදාළ භාණ්ඩය,
1. සාමාන්‍ය භාණ්ඩයකි. 2. ගිෆන් භාණ්ඩයකි. 3. බාල භාණ්ඩයකි.
4. ආදේශන භාණ්ඩයකි. 5. අනුපූරක භාණ්ඩයකි.

08. අඹ සඳහා ඉල්ලුම් වක්‍රය ඍජුකෝණාස්‍රකාර බහුවලයක හැඩය ගනී. අඹ ගෙඩියක මිල රුපියල් 20.00 ක් වූ අතර එවිට අලෙවි වූ අඹ ප්‍රමාණය ඒකක 1000කි. නිෂ්පාදකයාට අඹ ගෙඩි 1250 ක් අලෙවි කිරීමට අවශ්‍යනම් අඹ ගෙඩියක් අලෙවි කළ යුතු මිල රුපියල්
1. 16 කි. 2. 20 කි. 3. 24 කි. 4. 28 කි. 5. 32 කි.

09. X නැමැති භාණ්ඩයක හරස් ඉල්ලුම් නම්‍යතාවය 3 ක් වේනම් ඉන් ප්‍රකාශ වන වඩාත් නිවැරදි කරුණ වන්නේ,
1. ආදාළ භාණ්ඩය සමාන්‍ය භාණ්ඩයක් බවය.
2. ආදාළ භාණ්ඩය බාල භාණ්ඩයක් බවය.
3. ආදාළ භාණ්ඩය සුඛෝපභෝගී භාණ්ඩයක් බවය.
4. ආදාළ භාණ්ඩය සමීප අනුපූරක සහිත භාණ්ඩයක් බවය.
5. ආදාළ භාණ්ඩය සමීප ආදේශක භාණ්ඩයක් බවය.

10. එක්තරා නගරයක භාණ්ඩයක ආදායම් ඉල්ලුම් නම්‍යතාවය -1.5 ක් වූයේ නම් නගරයේ පුරවැසියන්ගේ ආදායම් වැඩිවීමක්,
1. ඉල්ලුම් ප්‍රමාණය වැඩිවීමට හේතු වේ.
2. ඉල්ලුම් ප්‍රමාණය අඩුවීමට හේතු වේ.
3. ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීමට හේතු වේ.
4. ඉල්ලුම් වක්‍රය වමට විතැන් වීමට හේතු වේ.
5. සැපයුම් වක්‍රය මත ඉහළට චලනයක් ඇති කරයි.

11. ඇඹුල් කෙසෙල් සඳහා වූ සැපයුම් වක්‍රය QS = -300 +10 p වේ. කෙසෙල් 1kg මිල රුපියල් 50 ත් හා 100ත් අතර පරාසයක් තුල පවතින විට සැපයුම් නම්‍යතාවය වන්නේ,
1. 1.25 2. 1.5 3. 1.85 4. 2 5. 1.66

12. සමතුලිතව පවතින වෙළෙඳපොළක සමතුලිතයේදී ඉල්ලුම් නම්‍යතාවය හා සැපයුම් නම්‍යතාවය පිළිවෙලින් -0.5 ක් හා 1.2 ක් විය. සමතුලිතයේ කිසිදු වෙනසක් සිදු නොවී ඉල්ලුම් නම්‍යතාවය -1.5 ක් ලෙසට හා සැපයුම් නම්‍යතාවය 0.8 ක් ලෙස වෙනස් වූයේ නම් මෙම වෙළඳපලේ,
1. පාරිභෝගික අතිරික්තය වැඩි වේ හා නිෂ්පාදන අතිරික්තය අඩු වේ.
2. පාරිභෝගිත අතිරික්තය අඩු වේ හා නිෂ්පාදන අතිරික්තය වැඩි වේ.
3. නිෂ්පාදන අතිරික්තය මෙන්ම පාරිභෝගික අතිරික්තයද වැඩි වේ.
4. පාරිභෝගික අතිරික්තය පමණක් වැඩි වේ.
5. නිෂ්පාදන අතිරික්තය පමණක් වැඩි වේ.

13. තරඟකාරී මාළු වෙළඳපොළක කිලෝ එකක මිල රුපියල් 1000 දී අලෙවිය 5000kg කි. ඉන් මසකට පසුව මාළු මිලෙහි කිසිදු වෙනසක් සිදු නොවී 8000kg අලෙවි වූයේ නම් ඊට හේතු වන්නේ ,

1. රජය ධීවරයන්ට මෙන්ම පාරිභෝගිකයන්ට 10% බැගින් වෙන වෙනම සහනාධාර ලබා දීම.
2. ඉල්ලුම් වක්‍රය දිගේ පහළට ගමන් කිරීම.
3. සැපයුම් වක්‍රය දිගේ ඉහළට ගමන් කිරීම.
4. මාළු කෑමේ රුචිය ඉහළ යාම.
5. මස් මිල ඉහළ යාම හා ඉන්ධන මිල ඉහළ යාම.

14. පහත දැක්වෙන රූපසටහන මගින් කිසියම් පාරිභෝගික භාණ්ඩයක් සඳහා ඇති තරඟකාරී වෙළඳපොලක් නිරූපනය කරයි. $P_1$ හා $P_2$ අතර වෙනසින් දැක්වෙන්නේ විශේෂිත බද්දේ වටිනාකමයි.




| | පාරිභෝගික අතිරික්තය | නිෂ්පාදන අතිරික්තය | අධි බදු බර | රජයේ බදු ආදායම |
|---|---|---|---|---|
| 1. | A | D | EF | BC |
| 2. | AB | CD | GH | BCEF |
| 3. | ABE | CDF | EF | BC |
| 4. | AE | CDF | GH | GH |
| 5. | ABC | BCD | BCEF | GH |

15. තරඟකාරී වෙළඳපළකට රජය මැදිහත්වීම හේතුවෙන් නිෂ්පාදක අතිරික්තය මෙන්ම පාරිභෝගික අතිරික්තයෙහි වැඩිවීමක් සිදුවුවන්නේ නම් ඒ සඳහා හේතු වන්නේ,

1. විශේෂිත බද්දක් අයකිරීම
2. විශේෂිත සහනාධාරයක් ලබා දීම.
3. නිෂ්පාදන සලාක නියම කිරීම.
4. උපරිම මිල ප්‍රතිපත්තිය ක්‍රියාත්මන කිරීම.
5. සහතික මිල යටතේ අධිසැපයුම මිලට ගැනීම.

16. පහත දැක්වෙන්නේ කෘෂිකාර්මික භාණ්ඩ වර්ග 05ක ඉල්ලුම් නම්‍යතාවය හා සැපයුම් නම්‍යතාවයන්ය. මෙම වෙළඳපොළ අතරින් මිල ස්ථායිතාවය වඩාත්ම දැකගත හැකි වෙළඳපල වන්නේ,

| වෙළඳපළ | ඉල්ලුම් නම්‍යතාවය | සැපයුම් නම්‍යතාවය |
|---|---|---|
| 1 | -2 | 1 |
| 2 | -1 | 1 |
| 3 | -3 | 5 |
| 4 | -0.1 | 0.2 |
| 5 | -0.8 | 1 |

17. කෙටි කාලයේදී නිෂ්පාදන ආයතනයක් විසින් විවිධ නිමැවුම් මට්ටම් සඳහා දරන මුළු පිරිවැය පහත දැක්වෙන වගුවෙන් පෙන්නුම් කරයි.

| නිමැවුම් මටට්ම | මුළු පිරිවැය |
|---|---|
| 0 | 200 |
| 1 | 250 |
| 2 | 270 |
| 3 | 285 |
| 4 | 290 |
| 5 | 300 |

මෙම තොරතුරු වලට අනුව නිමැවුම ඒකක 5 දී සාමන්‍ය විචල්‍ය පිරිවැය කොපමණද?

1. රු. 60   2. රු.20   3. රු.40   4. රු.100   5. රු.10

18. නිෂ්පාදනයේ කෙටි කාලයේදී නිමැවුම වැඩිකරන විට අඛණ්ඩව පහල බැසිය යුත්තේ කුමන පිරිවැයක්ද?

1. සාමන්‍ය මුළු පිරිවැය   2. සාමන්‍ය විචල්‍ය පිරිවැය   3. මුළු විචල්‍ය පිරිවැය
4. ආන්තික පිරිවැය   5. සාමන්‍ය ස්ථාවර පිරිවැය

19. පරිමාණානුකූල පිරිමැසුම් වලට මුහුණදෙමින් සිටින නිෂ්පාදන ආයතනයක් අත්විඳින තත්ත්වයක් වන්නේ,

1. දිගුකාලීන සමාන්‍ය පිරිවැය වැඩි වීමයි.
2. කෙටි කාලයේදී සාමාන්‍ය විචල්‍ය පිරිවැය ඉහලයාමයි.
3. නිමැවුම් කුමන ආකාරයෙන් වෙනස් වුවත් දිගුකාලීන සාමාන්‍ය පිරිවැය නොවෙනස්ව පැවතීමයි.
4. දිගුකාලීන සාමන්‍ය මුළු පිරිවැය අඩුවීමයි.
5. යෙදවුම් වැඩිකරන අනුපාතයට වඩා අඩු අනුපාතයකින් නිමැවුම වැඩිවීමයි.

20. පහත සඳහන් දෑ අතරින් පූර්ණ තරගකාරී වෙළඳපලක සාමන්‍ය ලක්ෂණයක් නොවන්නේ,

1. නව ආයතන වලට කිසිදු බාධාවකින් තොරව වෙළඳපලට ප්‍රවේශවිය හැකිවීම.
2. වෙළඳපල ආයතන සමාජාතිය භාණ්ඩ නිපදවීම.
3. වෙළඳපල තොරතුරු පූර්ණව හා පිරිවැයකින් තොරව ලබාගත හැකිවීම.
4. වෙළඳපල ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍යවීම.
5. දිගුකාලයේදී ප්‍රාමාණික ලාභ ඉපැයීම.

21. කෙටි කාලයේදී පූර්ණ තරගකාරී ආයතනයක් ආර්ථික අලාභ ලබනුයේ,

1. මිල සාමාන්‍ය මුළු පිරිවැයට වැඩිවන විට.
2. මිල ආන්තික පිරිවැයට සමාන වීම.
3. මිල සාමාන්‍ය මුළු පිරිවැයට අඩුවන විට.
4. ආන්තික ආභාරය සාමාන්‍ය අයභාරයට සමාන වන විට.
5. ආන්තික ආභාරය සමාන්‍ය ස්ථාවර පිරිවැයට සමාන වන විට.

22. දළ දේශීය නිෂ්පාදිතය ගණනයේදී සැලකිල්ලට ගන්නා අයිතමයක් වන්නේ,

1. පාවිච්චිකල දුරකතනයක් මිලදී ගැනීමට දරන වියදම.
2. ව්‍යාපාර කොටස් මිලදී ගැනීම හා විකිණීම.
3. රජය කුටුම්භ වෙත ලබා දෙන සංක්‍රාම.
4. හේන් වගාවෙන් නිෂ්පාදකයා පරිභෝජනයට ගැනෙන ආහාර වර්ග.
5. ගෘහනියක් කුටුම්භයක් තුල ඉටුකරන කටයුතු.

23. දළ දේශීය නිෂ්පාදිතය ගණනයේදී පාරිභෝගික වියදම ( C) ලෙස වර්ගීකරණයට ලක්වනුයේ මේවායින් කවරක්ද?

1. සමාගමක් සතු ව්‍යාපාර කොටස් 500 මිලදී ගැනීම.   2. පාරිභෝජන පරිමාර්ථයෙන් නිවසක් ඉදිකිරීම.
3. රජය අධිවේගී මාර්ග 10km කොටසක් ඉදිකිරීම.   4. ඇදුම් නිෂ්පාදනය සඳහා රෙදි 100m මිලදී ගැනීම.
5. පාරිභෝගික පරමාර්ථයෙන් පුද්ගයෙකු නව මොටර් රථයක් මිලදී ගැනීම.

24. ආදායම් ප්‍රවේශය ඔස්සේ දළ ජාතික ආදායම ඇස්තමේන්තු කිරීමේදී ඇතුලත් නොකරනුයේ පහත දෑ අතරින් කුමක්ද?
   1. මිශ්‍ර ආදායම්
   2. සේවක ආදායම්.
   3. නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු.
   4. ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය.
   5. සේවා යෝජකයන් සේවක ආර්ථසාධක අරමුදලට ගෙවන දායකත්ව මුදල.

25. බොහෝදුරට අඩුවන සෘණ නිමවුම් පරතරයක් සහිත ලක්ෂයකින් සමන්විත වන්නේ ව්‍යාපාර චක්‍රයක කවර අදියරක්ද?
   1. පසු බැසීම 2. පතුල 3. ප්‍රසාරණය 4. මුදුනත 5. වර්ධනය

26. ආර්ථිකයක සමාහාර වියදමේ වැඩිවීමක් හටගත හැක්කේ පහත සඳහන් කවරක් අඩුවීම නිසාද?
   1. පරිභෝජන වියදම 2. ආණ්ඩුවේ මිලදී ගැනීම් 3. ආයෝජන වියදම
   4. අපනයන වියදම් 5. ආනයන වියදම්

27. 2023 වර්ෂයේ පවත්නා වෙළඳ මිල අනුව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ඇමරිකානු ඩොලර්,
   1. බිලියන 100 2. බිලියන 90 3. බිලියන 84 4. බිලියන 80 5. බිලියන 150

28. විවෘත ආර්ථිකයක සමාහාර වියදමේ සංරචක නිවැරදිව දැක්වෙන්නේ කුමන වරණයේද?
   1. පරිභෝජන වියදම (C) , ඉතුරුම් (S), ආයෝජනය (I) සහ රජයේ වියදම (G)
   2. පරිභෝජන වියදම (C) , රජයේ වියදම (G) ආයෝජනය (I) සහ ශුද්ධ අපනයන (X- M)
   3. රජයේ වියදම (G) , ආනයන (M) , ආයෝජනය (I) සහ රජයේ වියදම (G)
   4. පරිභෝජන වියදම (C) , ආයෝජනය (I), රජයේ වියදම (G) සහ අපනයනය (X)
   5. පරිභෝජන වියදම (C) , සංක්‍රාම (Tr), බදු (Tx) සහ ශුද්ධ අපනයනය (X - M)

29. එක්තරා සරල ආර්ථිකයක පාරිභෝජන ශ්‍රිතය $C = 200 + 0.8y$ ලෙස ලබා දී ඇත. මෙම ආර්ථිකයේ සමතුලිත ජතික ආදායම රුපියල් මිලියන 5000 නම් මෙම මට්ටමේදී ආර්ථිකයේ ආයෝජන වල වටිනාකම කීයද?
   1. රු.මි 1000 2. රු.මි 4200 3. රු.මි 3000 4. රු.මි 800 5. රු.මි 5000

30. කල්පිත ආර්ථිකයක ආයෝජන වියදම රු.මි. 120 කින් ඉහල යාමක ප්‍රතිඵලයක් ලෙස සමතුලිත ජාතික ආදායම රු.මි 2000 සිට රු.මි 2600 දක්වා ඉහල ගියේ නම් ඉන් ගම්‍ය වන්නේ කල්පිත ආර්ථිකයේ,
   1. ආයෝජන ඉල්ලුම රු.මි 600 කින් වැඩි වී ඇති බවයි.
   2. රජයේ මිලදී ගැනිම් රු.මි 400 කින් වැඩි වී ඇති බවයි.
   3. ආන්තික පරිභෝජන නැමියාව 80% ක් වන බව.
   4. ආන්තික ඉතුරුම් නැමියාව 40% කි වන බව.
   5. පෙලඹුම් පාරිභෝජනය 20%කින් වැඩි වී ඇති බව.

31. ආන්තික ඉතුරුම් නැමියාව 0.4ක් වන ආර්ථිකයක පවත්නා නිමැවුම් මට්ටම රු.බි. 4000ක් වන අතර පූර්ණ සේවා නියුක්ති මට්ටම රුපියල් බිලියන 5500 කි. පූර්ණ සේවා නියුක්ති මට්ටම අත්කර ගැනීමට දායක වන්නේ,
   1. රජයේ මිලදී ගැනීම රුපියල් බිලියන 800 කින් වැඩි කිරීම.
   2. ආර්ථිකයේ වියදම රුපියල් බිලියන 1500 කින් වැඩි කිරීම.
   3. පෞද්ගලික පාරිභෝජන වියදම රුපියල් බිලියන 500 කින් ඉහල නැංවීම.
   4. සෘජු බදු බිලියන 1500 කින් අඩු කිරීම.
   5. රුපියල් බිලියන 1000කින් සෘජු බදු අඩු කිරීම.

32. ගණුදෙනු මුදල් ඉල්ලුම ඉහල යාම කෙරේ බලපානු ලබන සාධකය වන්නේ,
   1. ඒක්ෂන මුදල් වෙළඳපොල පොලී අනුපාතිකය වැඩිවීමය.
   2. සතිපතා වැටුප් ලබන්නන්ගෙන් 70% කට වඩා මාස්පතා වැටුප් ලබන්නන් බවට පත් වේ.
   3. මූර්ත ආදායම හා නාමික ආදායම එකවර පහත වැටීම.
   4. මිල මට්ටම අඩුවෙමින් තිබියදී නාමික ආදායම පහල වැටීම.
   5. උද්ධමන අනුපාතිකය පහල යතැයි අපේක්ෂා කිරීම.

33. කිසියම් කල්පිත ආර්ථිකයක මුදල් සැපයුම රුපියල් ට්‍රිලියන 5 ක් නම් මුදලේ සංසරණ ප්‍රවේගය 4 ක් නම් එම ආර්ථිකයේ නාමික දළ දේශීය නිෂ්පාදිතය වන්නේ,

1. 9 2. 1 3. 1.25 4. -20 5. 0.8

34. වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ ශ්‍රී ලංකා මහ බැංකුව වානිජ තැන්පතු මත පනවන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පහත හෙලීමට තීරණය කරනු ලබයි. ඒ අනුව වර්තමාන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය වන්නේ,

1. 10% 2. 2% 3. 6% 4. 5% 5. 4%

35. x වානිජ බැංකුව තම ගණුදෙනුකරුවෙකුට මෝටර් රථයක් මිලදී ගැනීමට ණයක් සපයයි. එම ගනුදෙනුකරුවා එම චෙක්පත y බැංකුවේ ගිණුම් හිමි තම මිතුරෙකුට දී කාරයක් මිලදී ගනී. ඔහු එය තම y බැංකුවේ තැන්පත් කල පසු එම චෙක්පත නිශ්කාශනයෙන් පසු y බැංකුවේ,

| | මුදල් සංචිත | තැන්පතු |
|---|---|---|
| 1. | වැඩි වේ. | වැඩි වේ. |
| 2. | වැඩි වේ. | වෙනස් නොවේ. |
| 3. | වැඩි වේ. | වෙනස් නොවේ. |
| 4. | වෙනස් නොවේ. | වෙනස් නොවේ. |
| 5. | අඩු වේ. | වෙනස් නොවේ. |

36. වානිජ බැංකු තම තැන්පතු හිමියන්ගේ ගිණුම් යොදා ගනිමින් නිකුත් කෙරෙන ණය මුදල් රටේ පදනම් මුදල් සැපයුම හා මුදල් සැපයුම කෙරෙහි කවර බලපෑමක් ඇති කරනු ලබයිද?

| | පදනම් මුදල් | මුදල් සැපයුම |
|---|---|---|
| 1. | වැඩි වේ. | වැඩි වේ. |
| 2. | අඩු වේ. | වෙනස් නොවේ. |
| 3. | වෙනස් නොවේ. | වැඩි වේ. |
| 4. | අඩු වේ. | වැඩි වේ. |
| 5. | වෙනස් නොවේ | වෙනස් නොවේ. |

37. ශ්‍රී ලංකා මහ බැංකුවේ නූතන මූල්‍ය ප්‍රතිපත්තියේ මෙහෙයුම් ඉලක්කය වන්නේ,

1. සංචිත මුදල්
2. විවට වෙළඳපොල මුදල්
3. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය
4. මහ බැංකු පොලී අනුපාතය
5. හරිත සාමාන්‍ය ඒක්ෂණ පොලි අනුපාතිකය.

38. වානිජ බැංකුවක ශේෂපත්‍රයේ තැන්පතු කිසියම් ප්‍රමාණයකින් වැඩි වී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 15% ක් වන විට අවශ්‍ය කරන සංචිතය රුපියල් 300ක් විය. එවිට වානිජ බැංකුව භාරගෙන ඇති නව තැම්පතුවේ වටිනාකම වනුයේ,

1. රු. 1000 2. රු. 2000 3. රු.3000 4. රු. 4000 5. රු.5000

39. පහත සඳහන් දෑ අතුරින් වෙළඳපොළ අසමත්වීම් හටගනු ලබන මූලාශ්‍රයක් වන්නේ,

1. බාහිරතා පිළිබඳව සැලකිලිමත් වීම.
2. වෙළඳපොළේ තරඟය පැවතීම.
3. සාධක සංචලතාවක් පැවතීම.
4. ආදායම් බෙදීයාමේ විෂමතා වැළැක්වීමට රජය මැදිහත් වීම.
5. ආර්ථිකයේ ඇතිවන උච්චාවචනය හේතුවෙන් කෙටි කාලීන අස්ථායිතා ඇති වීම.

40. පොදු භාණ්ඩ, අර්ධ පොදු භාණ්ඩ හා පොදු සම්පත් නිවැරදිව දක්වා ඇති වරණය වන්නේ,

| | පොදු භාණ්ඩ | අර්ධ පොදු භාණ්ඩ | පොදු සම්පත් |
|---|---|---|---|
| 1. | කලාගාර | ප්‍රදීපාගාර | හිරු බැසයාම |
| 2. | රූපවාහිනී තරංග | අධිවේගී මාර්ග | භූගත ජල සම්පත |
| 3. | තෘණ භූමි | ජාතික ආරක්ෂාව | පිරිසිදු වාතය |
| 4. | වීදි ආලෝකකරණය | පරිසරය සුරැකීම | මත්ස්‍ය සම්පත |
| 5. | වනාන්තර | සිනමාශාලා | වායුගෝලීය සම්පත් |

41. කෘෂි භෝග වගාව සඳහා රසායනික පොහොර භාවිතයේ පෞද්ගලික පිරිවැය රුපියල් බිලියන 70 ක් වූ අතර පෞද්ගලික ප්‍රතිලාභ රුපියල් බිලියන 85 කි. එහි බාහිර පිරිවැය හා බාහිර ප්‍රතිලාභ පිළිවෙලින් රුපියල් බිලියන 30ත් 10 ත් වේ. ඉහත තොරතුරු වලට අනුව,

1. වෙළඳපළ ආර්ථිකය තුළ අධි නිෂ්පාදනයක් හට ගනී.
2. සමාජ පිරිවැය ඉක්ම වූ සමාජ ප්‍රතිලාභයක් දක්කට ලැබේ.
3. සමාජ ප්‍රතිලාභය රුපියල් බිලියන 55 කි.
4. වෙළඳපොළ ආර්ථිකය තුළ ඌන පරිභෝජනයක් හට ගනී.
5. සමාජ ප්‍රතිලාභ ඉක්ම වූ පෞද්ගලික පිරිවැයක් දක්නට ලැබේ.

42. උග්‍ර පසුබෑමකට මුහුණ පා සිටින ආර්ථිකයකට නිමැවුම ඉහළ නැංවීමෙහිලා වඩාත් යෝග්‍ය සඵල රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය වනුයේ,

1. පොළී අනුපාත පහළ හෙළීම.
2. මහ බැංකුව ප්‍රතිපත්තිමය පොළී අනුපාතකය පහළ දැමීම.
3. ආදායම් බදු පහත හෙළීම.
4. ආණ්ඩුවේ වියදම පහත දැමීමය.
5. මහ බැංකුව විවට වෙළඳපොළෙහි සුරැකුම්පත් අලෙවි කිරීම.

43. 2024 වර්ෂයේ රාජ්‍ය ආදායම තුළ ඉහළම දායකත්වය සැපයූ මූලාශ්‍රය වන්නේ,

1. එකතු කළ අගය මත බදු
2. ආදායම් බදු
3. නිෂ්පාදන / සුරා බදු
4. ගාස්තු හා අයකිරීම්
5. කුලී හා පොලී ආදායම්

44. එක්කරා පුද්ගයෙකුගේ වාර්ෂික ආදායම සහ එක් එක් ආදායම් මට්ටමේදී ගෙවනු ලබන බදු මුදල පහත වගුවේ දැක්වේ.

| වාර්ෂික ආදායම (රු.) | බදු මුදල (රු) |
|---|---|
| 500000 | 50000 |
| 800000 | 72000 |
| 1000000 | 80000 |

ඉහත බදු ක්‍රමය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

| | බදු ක්‍රමය | සාධාරණත්වය |
|---|---|---|
| 1. | අනුක්‍රමික | ආරක්ෂා වේ. |
| 2. | ප්‍රතික්‍රමික | ආරක්ෂා වේ. |
| 3. | සමානුපාතික | නිශ්චිතව කිව නොහැක. |
| 4. | ප්‍රතික්‍රමික | ආරක්ෂා නොවේ. |
| 5. | අනුක්‍රමික | ආරක්ෂා නොවේ. |

45. අයවැය පරතරය විග්‍රහ කිරීමේදී යොදා ගැනෙන මිනුමක් නොවන්නේ,

1. වර්තන ගිණුමේ ශේෂය
2. සමස්ත ශේෂය
3. ප්‍රාථමික ගිණුමේ ශේෂය
4. ශුද්ධ මූල්‍ය හිඟය
5. ප්‍රාග්ධන ගිණුමේ ශේෂය

46. පහත දැක්වෙන අයවැය ලේඛනය ආශ්‍රිත සංකල්ප ඇසුරින් වඩාත් නිවැරදි අයවැය සංකල්පයක් වන්නේ,

1. රජයේ මුළු ලැබීම් = බදු අයභාරය + බදු නොවන ආදායම
2. ප්‍රාථමික වියදම = පුනරාවර්තන වියදම + ප්‍රාග්ධන වියදම + පොලී ගෙවීම්
3. ප්‍රාථමික ගිණුමේ ශේෂය = මුළු ලැබීම් - පොලී ගෙවීම් හැර වර්තන වියදම
4. දළ මූල්‍යයන අවශ්‍යතා = ණය ආපසු ගෙවීම් - සමස්ත අයවැය ශේෂය
5. වර්තන ගිණුමේ ශේෂය = මුළු ලැබීම් - පුනරාවර්තන වියදම.

47. ණය ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් ශ්‍රී ලංකාවට මේ වන විට වැඩිම ණය සහනයක් ලබා දී ඇත්තේ,

1. ද්විපාර්ශවිය නිල ණය හිමියන්ගේ කමිටුව (OCC)
2. චීනය EXIM බැංකුව
3. චීන සංවර්ධන බැංකුව
4. ස්වෛරීත්ව බැඳුම්කර හිමියන්
5. පැරිස් සමාජයට අයත් නොවන ද්විපාර්ශවිය ණය හිමියන්

48. පහත දැක්වෙන්නේ සමාන සම්පත් ඒකකයක් භාවිතයෙන් තිරිඟු හා රෙදි නිෂ්පාදනය කිරීමේ ඇමරිකාවට සහ එංගලන්තයට ලබාගත හැකි උපරිම නිමැයුම් ප්‍රමාණයයි.

| | ඇමරිකාව | එංගලන්තය |
|---|---|---|
| තිරිඟු | 10 | 08 |
| රෙදි | 20 | 10 |

ඉහත දත්ත වලට අනුව වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. තිරිඟු නිෂ්පාදනය කිරීමේ නිරපේක්ෂ වාසි එංගලන්තය සතුවේ.
2. රෙදි නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසි එංගලන්තය සතුවේ.
3. තිරිඟු නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසි එංගලන්තය සතුවේ.
4. තිරිඟු නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසි ඇමරිකාව සතුවේ.
5. රෙදි නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසි එංගලන්තය සතුවේ.

49. ආනයනික අත් බෑගයක මිල රු. 5000/- කි. එය දේශීයව නිපදවීමේදී ආනයනික යෙදවුම් සඳහා රු.4000 ක් වැය වේ. ආනයනික භාණ්ඩය සඳහා මෙන්ම යෙදවුම් සඳහා 10% බැගින් බදු අය කලේ නම් මෙම ආර්ථිකයේ සඵල ආරක්ෂණ අනුපාතය වන්නේ,

1. 5% 2. 10% 3. 15% 4. 20% 5. 25%

50. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම අපනයන සහ ආනයන ගමනාන්තරයන් වන්නේ,

1. ඇ.එ. ජනපදය හා ඉන්දියාවයි.
2. ඉන්දියාව සහ චීනයයි.
3. චීනය සහ ඇ.එ. ජනපදයයි.
4. චීනය හා රුසියාවයි.
5. රුසියාව සහ ඇ.එ. ජනපදයයි.

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / Grade: 13 | විෂයය / Subject: ආර්ථික විද්‍යාව - II | කාලය / Time: පැය 03 |

නම : ......................................................................................................................................................................

උපදෙස්
★ අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න දෙකක් වන පරිදි ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## අ කොටස

01. (i) ආර්ථික සම්පත් නිර්වචනය කර එය වර්ගීකරණය කළ හැකි ආකාරය දක්වන්න. (ල. 4)
(ii) හිඟකම හේතුවෙන් ආර්ථිකයන් තුළ තෑප කිරීම බිහිවන්නේ කෙසේ සැයි හඳුන්වන්න. (ල. 4)
(iii) නිෂ්පාදන හැකියා මායිම්වක්‍ර රූප සටහනක් ඇසුරින් නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව සහ සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව පෙන්වා සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව බිහි වීමට හේතු දක්වන්න. (ල. 5)
(iv) ව්‍යවසායකයාගේ ප්‍රධාන කාර්යයන් මොනවාද? (ල. 4)
(v) ආර්ථික පද්ධති වර්ගීකරණය සඳහා යොදාගන්නා නිර්ණායක 3 ක් ලියන්න. (ල. 3)

02. (i) ඉල්ලුම් නීතියට හේතුව ආදායම් ප්‍රතිවිපාකය යන්න නිර්වචනය කරන්න. සාමාන්‍ය භාණ්ඩයක හා බාල භාණ්ඩයක ආදායම් ප්‍රතිවිපාකය හැසිරෙන්නේ කෙසේදැයි පෙන්වා දෙන්න. (ල. 4)
(ii) මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය, හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය, ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය අනුව භාණ්ඩ වර්ග කර දක්වන්න. (ල. 3)
(iii) අර්තාපල් 1Kg ක මිල රුපියල් 200 යේදී ඉල්ලුම් ප්‍රමාණට 1000kg කි. කිලෝ 01 ක මිල රු. 100 දී අලෙවිය 5000kg කි. අර්තාපල් සඳහා පවතින මිල ඉල්ලුම් නම්‍යතාවය පැහැදිලි කරන්න. (ල. 3)
(iv) පහත දැක්වෙන $QS_1, QS_2, QS_3$ සැපයුම් වක්‍රවල සැපයුම් නම්‍යතාවයේ ස්භාවය සැකවින් දක්වන්න. (ල. 3)




(v) නම්‍ය සැපයුමක් හා අනම්‍ය ඉල්ලුමක් පවතින වෙළෙඳපළක් සමතුලිතතාවයේ පවතී. එම වෙළෙඳපලේ වඩා වැඩි පාරිභෝගික අතිරික්තයද, නිෂ්පාදන අතිරික්තයද, යෝග්‍ය රූප සටහනකින් පෙන්වා දෙන්න. (ල. 3)

(ආ)(vi) තරඟකාරී මාළු වෙළෙඳපළක ඉල්ලුම් සමීකරණ 1000 -5P වේ. සැපයුම් -200+5P වේ. ධීවරයන්ට ලබාදුන් සහනාධාරයක් හේතුවෙන් සැපයුම් සමීකරණය QS = 5P බවට පත් වූයේ නම් සහනාධාරයට පෙර හා පසු වෙළඳපළෙහි සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ල. 4)

03. (i) සාමාන්‍ය ඉල්ලුම් වක්‍රයක් හා සාමාන්‍ය සැපයුම් වක්‍රයක් සහිත, සමතුලිතව පවතින තරඟකාරී වෙළෙඳ -පළකට රජය විසින් විශේෂිත බද්දක් පැනවීම නිසා සම්පත් බෙදා වෙන්කිරීම ආකාර්යක්ෂම වන ආකාරය සුදුසු ප්‍රස්ථාර සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 4)

(ii) අනම්‍ය ඉල්ලුමක් හා නම්‍ය සැපයුමක් සහිතව සමතුලිතව පවතින වෙළෙඳපළක නිෂ්පාදන සහනාධාරයක් ලබා දීමෙන් පසු පාරිභෝගිකයා ලබන වාසිය සහ නිෂ්පාදකයා ලබන වාසිය යෝග්‍ය රූපසටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) තරඟකාරී වෙළෙඳපළකට අදාල ඉල්ලුම් සමීකරණය Qd = 600 - 10p . සැපයුම් සමීකරණය Qs = 10p. රජය රුපියල් 40ක සහතික මිලක් නියම කර අධි සැපයුම මිලදී ගැනීමට කටයුතු කරයි.

(අ) අධි සැපයුම මිලදී ගැනීම සඳහා රජයට දැරීමට සිදුවන වියදම කොපමණද? (ල. 3)
(ආ) රජය අධිසැපයුම මිලදී ගැනීම නිසාවෙන් සුබසාධන පාඩුව ගණනය කරන්න. (ල. 3)
(ඇ) සහතික මිල ක්‍රියාත්මක කිරීම නිසා සම්පත් බෙදා වෙන් කිරීම ආකාර්යක්ෂම වීම හේතුවෙන් සමාජ සුබසාධනයේ සිදුවන අඩුවීම ගණනය කරන්න. (ල. 3)

(iv) කෘෂිකාර්මික බෝගවල මිල ස්ථායිව පවත්වා ගැනීමට රජයට ගතහැකි ක්‍රියාමාර්ග සඳහන් කරන්න. (ල. 3)

04. (i) '' යම් නිෂ්පාදනයක් සම්බන්ධ ආර්ථික විද්‍යාවේදී ගණනය කරන ලාභයට වඩා එම නිෂ්පාදනය සම්බන්ධව ගිණුම්කරණයේදී ගණනය කරන ලාභය වැඩි අගයක් ගනී '' ඔබ එකඟද? හේතු දක්වන්න. (ල. 4)

(ii) ඇඟළුම් නිෂ්පාදන ක්‍රියාවලිය ආශ්‍රිත හටගන්නා ස්ථාවර හා විචල්‍ය පිරිවැය හඳුනාගෙන ඒ අතර වෙනස පැහැදිලි කරන්න. (ල. 4)

(iii) '' පූර්ණ තරඟකාරී ආයතනයක් කෙටි කාලයේදී පාඩු ලබන්නේ නම් ඒ සඳහා ක්ෂණිකව ගතයුතු තීරණය විය යුත්තේ ආයතනය වසා දැමීමයි.'' මෙම ප්‍රකාශනයට ඔබ එකඟද? පැහැදිලි කරන්න. (ල. 4)

(iv) පුද්ගලයෙකු දැනට ආරම්භකොට ක්‍රියාත්මක කරගෙන යන ව්‍යාපාර ආයතනයක් රු. 200,000 ක මාසික ආදායමක් උපයයි. ඔහු මින්පෙර නිරතව සිටි රැකියාවෙන් රුපියල් 120 000 ක මාසික වැටුපක් ඉපැයුහ. ව්‍යාපාරය පවත්වාගෙන යාමේ ගොඩනැගිල්ල සඳහා මාසිකව රු. 30 000 ක බදුකුලියක්ද රු. 5000 ක විදුලි බිලක් හා ආයතනයේ සේවකයෙකු සඳහා රු. 45000 ක මාසික වැටුපක්ද ගෙවිය යුතුවේ. ඔහු මෙම ව්‍යාපාරයෙන් ආර්ථික ලාභයක් හිමි කරගන්නේද? හේතු පහදන්න. (ල. 4)

(v) ඒකාකාරී කරඟ වෙළඳපල හා කතිපයාධිකාරී වෙළෙඳපල මූලික ලක්ෂණවල ඇති වෙනස්කම් මොනවාද? (ල. 4)

05. (i) ආර්ථික ප්‍රදේශය තුල හඳුනාගත හැකි ආයතනික ඒකක නම්කර එම ආයතනික ඒකක වල කාර්යභාරය කෙටියෙන් දක්වන්න. (ල. 4)

(ii) පහත සඳහන් සිදුවීම් දළ දේශීය නිෂ්පාදිතයට ඇතුලත් කරන්නේද? නොකරන්නේද? යන්න පහදන්න.
1. මැතිවරණ ව්‍යාපාරයක් තුල අපේක්ෂකයින් කුටුම්භ වෙත භාණ්ඩ බෙදීම.
2. මෙම වසරේ පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණය සඳහා රජය දැරූ වියදම.
3. පුද්ගලයෙකු සිය පෞද්ගලික පරිභෝජනය සඳහා පැරණි මෝටර් රථයක් මිල දීගැනීම. (ල. 1x 4 = 4)
4. රජය විශ්‍රාමිකයන් සඳහා ගෙවන විශ්‍රාම වැටුප ට රුපියල් 3000 ක දීමනාවක් එකතු කිරීම.

(iii) දළ දේශීය නිෂ්පාදිතය ගණනයේදී යොදාගනු ලබන ප්‍රාථමික ආදායම් යන්න හඳුන්වා ප්‍රාථමික අදායමේ ප්‍රධාන සංරචක මොනවාදැයි දක්වන්න. (ල. 4)

(iv) කල්පිත ආර්ථිකයක් පිළිබඳ සාර්ව ආර්ථික දත්ත පහත දැක්වේ. මෙම ආර්ථිකයේ ස්වාධීන පරිභෝජනය රු.මි 400ක් වන අතර වැයකලහැකි ආදායම වැඩිවන සෑම රුපියලකින්ම ශත 80 ක් පරිභෝජනය කරයි. ආයෝජනය (I) මිලියන 360කි. ආණ්ඩුවේ මිලදී ගැනීම් (G) මිලියන 200 කි. ස්වාධීන (T) මිලියන 200කි.

1. මෙම ආර්ථිකයේ ඉතුරුම් ශ්‍රිතය දක්වන්න. (ල. 2)
2. මෙම ආර්ථිකයේ සමතුලික ජාතික ආදායම් මට්ටම කොපමණද? (ල. 2)
3. සමතුලිත ජාතික ආදායම් වියදම් ප්‍රස්තාරය නිරූපනය කරන්න. (ල. 2)
4. සමතුලිත අවස්ථාවේදී පෞද්ගලික පාරිභෝජනය කොපමණද? (ල. 2)

## ආ කොටස

06\. (i) වටිනාකමේ සන්නිධියක් ලෙස ආර්ථිකය තුල මුදලේ අපේක්ෂිත කාර්යභාරය සීමා කෙරෙන සාධක කවරේද? පැහැදිලි කරන්න. (ල. 4)

(ii) මුදල් සැපයුමේ ඉහල යාමක් සිදුවීමට නම් පදනම් මුදල් ඉහල යාමක් අනිවාර්යෙන් සිදුවිය යුතුය. එකඟ වන්නේද? (ල. 4)

(iii) වානිජ බැංකු ශේෂ පත්‍රයේ (මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ) ඇතුලත් ඉහලම ද්‍රවශීල වත්කම් සහ ලාභදායි වත්කම් දෙක බැගින් දක්වන්න. (ල. 4)

(iv) උද්ධමනය පාලනය කිරීම සඳහා යොදා ගති හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග 4 ක් දක්වන්න. (ල. 4)

(v) වානිජ බැංකු පද්ධතියක කටයුතු කරන එක් වානිජ බැංකුවක මූල්‍ය තත්ත්වය පහත පරිදිය. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20% යැයි සිතන්න.

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| තැන්පතු | 200,000 | සංචිත | 40,000 |
| | | ණය | 160,000 |
| | 200,000 | | 200,000 |

මහ බැංකුව විසින් මෙම වානිජ බැංකුවට රු. 10000 ක සුරැකුම්පත් අලෙවි කරන ලදී. (ල. 2)

(අ) ඉහත ක්‍රියාවෙන් පසු බැංකුවේ ශේෂපත්‍රය වෙනස් වන්නේ කෙසේදැයි දක්වන්න.

(ආ) වානිජ බැංකු සුරැකුම්පත් මිලට ගැනීමට මුදල් සැපයුම් බලපාන්නේ කෙසේද? (ල. 2)

07\. (i) රටක උද්ධමකයක් පැවතීම ආර්ථියක් තුල මුදලේ අපේක්ෂිත කාර්යභාරය කෙරෙහි කුමන බලපෑමක් ඇති කරනු ලබයිද? (ල. 4)

(ii) '' මූල්‍ය සමස්තය මඟින් එක් සමජාතිය වත්කමක් නොව පුළුල් වත්කම් පරාසයක් ආවරණය වේ. මෙම ප්‍රකාශයෙන් අදහස් වන්නේ කුමක්ද? (ල. 4)

(iii) මේ වන විට ශ්‍රී ලංකාවේ වත්මන් මුදල් ප්‍රතිපත්ති රාමුව යටතේ 'නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයට' අනුකූලව ක්‍රියාත්මක කරනු ලබයි. නම්‍යශිලි උද්ධමන ඉලක්කකරණය යන්න පැහැදිලි කරන්න. (ල. 4)

(iv) ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව ප්‍රධාන අරමුණ සහ වෙනත් අරමුණු පැහැදිලි කරන්න. (ල. 4)

(v) වානිජ බැංකු පද්ධතියේ මුදල් මැවීමේ ක්‍රියාවලිය සිදුකරන විට පදනම් කරගන්නා උපකල්පන කවරේද? (ල. 4)

08\. (i) නිදහස් වෙළඳපොළ ආර්ථිකයක් තුළට ආණ්ඩුවේ මැදිහත්වීම අවශ්‍ය වන්නේ ඇයි ? (ල. 4)

(ii) කල්පිත සංඛ්‍යා දත්ත ඇතුළත් රාජ්‍ය අයවැය ලේඛනයකට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| ශීර්ෂය | රුපියල් මිලියනය |
|---|---|
| රාජ්‍ය ආදායම | 4000 |
| ප්‍රාග්ධන වියදම් ( ආර්ථික වර්ගීකරණය අනුව) | 700 |
| පුනරාවර්තන වියදම | 5000 |
| ප්‍රදාන | 100 |
| ප්‍රාථමික ගිණුමේ හිඟය | 200 |
| ණය ආපසු ගෙවීම් | 450 |
| දේශීය මූල්‍ය ණය | 1100 |
| ශුද්ධ ණයදීම් | 50 |

පහත දෑ ගණනය කරන්න.

(අ) වර්තන ගිණුමේ ශේෂය

(ආ) පොලී ගෙවීම්.

(ඉ) අයවැය හිඟය පියවීම සඳහා යොදාගත් විදේශ මූල්‍යනය

(ඊ) දළ මූල්‍යන අවශ්‍යතාව (ල. 4)

(iii) ''2023 හා 2024 වර්ෂයත් හිදී ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ගිණුමේ ශේෂය අතිරික්තයක් වාර්තා කරයි'' එය ශ්‍රී ලංකා ආර්ථිකයට වැදගත් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ල. 4)

(iv) රාජ්‍ය ණය තිරසාරභාවය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? රාජ්‍ය ණය තිරසාරභාවය ඇති කර ගැනීම සඳහා වර්තමානයේදී රජයට ලබා දී ඇති ඉලක්ක තුනක් නම් කරන්න. (ල. 4)

(v) ණය තිරසාර කර ගැනීමේ ඉලක්ක සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය 2025 - 2029 මැදි කාලීන රාජ්‍ය මූල රාමුවට අනුව ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇති ප්‍රතිසංස්කරණ මොනවාද? (ල. 4)

09. (i) ආර්ථික කාර්යක්ෂමතා දෘෂ්ටි කෝණයෙන් බලන විට වෙළඳපොළ විසින් ඕනෑවට වඩා භාණ්ඩ පරිභෝජනය කරන අවස්ථාවක් සුදුසු රූප සටහනක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ල. 4)

(ii) රාජ්‍ය මූල්‍ය ක්‍රියාවලියේ දක්නට ලැබෙන ව්‍යුහමය දුබලතා හතර නම් කරන්න. (ල. 4)

(iii) පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ සමස්ත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් 6% ඉක්මවූ අගයක් ගෙන ඇත. එවැනි අයවැය හිඟයක ප්‍රතිවිපාක මොනවාද? (ල. 4)

(iv) රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය යන්නේ අදහස් කරන්නේ කුමක්ද? රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා වැඩ පිළිවෙළක ඉලක්ක දක්වන්න. (ල. 4)

(v) රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ මේ වන විට ශ්‍රී ලංකාවට ලැබුණු ණය සහන මොනවාද? (ල. 4)

10. රටවල් දෙකක තිරිඟු හා රෙදි නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් දිනකට ශ්‍රමිකයෙකුගේ නිමැවුම පිළිබඳ සටහනකි

| භාණ්ඩය | එක්සත් ජනපදය | ඉන්දියාව |
|---|---|---|
| තිරිඟු | 8 | 4 |
| රෙදි | 4 | 3 |

(i) (අ) ඉහත දැක්වෙන සංඛ්‍යා ලේඛන භාවිතා කර මෙම වෙළඳාමේ නිරපේක්ෂ වාසිය ඇත්තේ කුමන රටකට ද යන්න පැහැදිලි කර ඒ පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් දක්වන්න. (ල. 4)

(ආ) සාපේක්ෂ වාසිය යන්න නිර්වචනය කර ඉහත ලේඛණයට අනුව එය හිමි වන රට නම් කරන්න. (ල. 4)

(ii) රටවල් අතර විදේශ වෙළඳාමක් ඇති වීමට නම් පැවතිය යුතු ආර්ථික සාධක නම් කරන්න. (ල. 4)

(iii) වෙළඳ ආරක්ෂණය හරහා රටකට අත්වන වාසි සහ අවාසි මොනවාද? (ල. 4)

(iv) තරඟකාරීත්ව වාසිය වශයෙන් හඳුන්වන්නේ කුමන තත්ත්වයක්දැයි පැහැදිලි කරන්න. (ල. 4)